**ශීර්ෂය 122 - ඉඩම් අමාත්‍යාංශය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ඉඩම් අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 සැප්තැම්බර් 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

**--------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරන ලද පොහොර කිලෝග්‍රෑම් 777,720 ක් කිලෝග්‍රෑම් 01 ක් රු.15 බැගින් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙත අලෙවි කිරීමෙන් ලැබිය යුතු රු.11,665,800 ක අලෙවි ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය(ඒසීඒ-1(i)) මගින් ඉදිරිපත්කර නොතිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපෘතියේ පොහොර සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙත අලෙවි කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ LRC කාබනික පොහොර ව්‍යාපෘතිය මගින් මෙට්‍රික් ටොන් 777.72 සඳහා 001 දරන ඉන්වොයිසිය නිකුත්කරනු ලැබ ඇත්තේ 2021.12.31 දින මගිනි. රජයේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ මුදල් පදනමට බැවින් 2021.12.31 දින නිකුත් කරන ලද ඉන්වොයිසියට අදාළ මුදල, අදාළ වර්ෂයේදී ලැබී නොමැති බැවින් උපචිත පදනමින් ගිණුම් ගත කිරීමට හැකියාවක් නැත. ඒ අනුව 2021 වර්ෂයේ ගිණුම්වල මෙය හෙළිදරව් කර නැත. | සමාලෝචිත වර්ෂයේදී අලෙවිකළ කාබනික පොහොර වෙනුවෙන් ලැබිය යුතු ආදායම මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ-1(i)) මගින් ඉදිරිපත් කළ යුතුය |

### 1.6.2. දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය(ඒසීඒ-06) සහ CIGAS පරිගණක යෙදවුමේ ස්ථාවර වත්කම් ලේඛනයේ(BOS Report) ඇතුළත් මූල්‍ය නොවන වත්කම් වටිනාකම් අතර රු.91,550 ක වෙනසක් පැවතුණි. | 2021 දෙසැම්බර් 31 දිනට CIGAS web interface හා සිගාස් පරිගණක යෙදවුම අතර වෙනසක් හඳුනා ගන්නා ලද අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව අදාළ නිවැරදි කිරීම 2022 ජනවාරි මස සිදු කර ඇත. | අමාත්‍යාංශ ගිණුම් ශේෂ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමග සසඳා වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ගබඩා මධ්‍යස්ථාන 05 ක් ඉදිකිරීම වෙනුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත රු.22,813,779 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 05 දින ගෙවා තිබුණද, අදාළ වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ ජංගම නොවන වත්කම් | දැනට භාවිතා වන CIGAS වැඩ සටහන තුළ කිසියම් ඉදිකිරීමක් සඳහා වන ගෙවීමක් වෙනුවෙන් work in progress ලෙස වත්කම් සටහන් කළ හැක්කේ 2104 වැය විෂය යටතේ වියදම් දැරීමේදී පමණක් වන අතර කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ වියදම් දරා ඇත්තේ 122-01-03-2509 වැය විෂයෙනි. ඒ අනුව අදාළ ඉදිකිරීම් වල වියදම වත්කම් ලෙස ගිණුම්ගත කිරීමේ හැකියාවක් නැත. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරන ලද වියදම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ (work in progress) යටතේ පෙන්නුම් කිරීම වෙනුවට අමාත්‍යාංශ වියදමක් ලෙස පෙන්වා තිබුණි. මෙම වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීමට CIGAS පරිගණක වැඩසටහන තුළ පහසුකම් නොමැති බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් වාර්තාකර තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ කෘෂිකාර්මික උපකරණ ලෙස පෙන්වා ඇති රු.30,200,495 ක වටිනාකම, පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ වියදම් වාර්තාව සමඟ සැසඳීමේදී  වත්කම් වර්ග 06 ක එකතුවෙහි රු.4,483,650 ක අඩුවක් පැවතුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාබනික පොහොර ව්‍යාපෘතියේ ගණකාධිකාරී විසින් අත්සන් තබන ලද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වත්කම් මූල්‍ය නොවන වත්කම් යටතේ නිවැරදිව ඇතුළත් කර ඇත. | අනුරාධපුර ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ කළාප සහකාර අධ්‍යක්ෂක විසින් විගණනය වෙත ඉදිරිපත් කළ වියදම් වාර්තාව අනුව අදාළ වෙනස්කම් පවතින බැවින් ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බත්තරමුල්ලේ ඉඩම් කොමසාරිස් ජනරාල්ට අයත් එහෙත් මෙම අමාත්‍යාංශය පිහිටි මිහිකත මැදුර ගොඩනැගිල්ලේ සිව්වන මහළ ඉදිකිරීමේ පළමු අදියර සඳහා රු.10,986,567 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 21 දින මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (Central Engineering Consultancy Bureau) වෙත අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු අතර, අදාළ වටිනාකම ජංගම නොවන වත්කම් ලේඛනයේ කෙරීගෙන යන වැඩ (Work in Progress) යටතේ සටහන්කිරීම වෙනුවට අමාත්‍යාංශයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීමට CIGAS පරිගණක වැඩසටහන තුළ පහසුකම් නොමැති බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් වාර්තාකර තිබුණි. | මෙම අත්තිකාරම නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නොව පවතින ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා බැවින් වැය විෂය 2104 යටතේ නොව 2001 යටතේ දරන ලද්දකි. ඒ අනුව work in progress ලෙස ගිණුම්ගත කිරීමේ හැකියාවක් නැත. වැඩි දියුණු කිරීම සඳහා ගෙවීම් කරන අවස්ථාවලදී එම වටිනාකම වත්කමේ අගයට එකතු කර දැක්වීම සිදු කළ හැකි වේ. | අමාත්‍යාංශය පිහිටි මිහිකත මැදුර ගොඩනැගිල්ලේ සිව්වන මහළ ඉදිකිරීම සඳහා දරන වියදම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වෙන්කළ රු.428,118,160 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක් හෙවත් රු.48,963,553 ක ඉතිරියක්ද, ප්‍රාග්ධන වියදම සඳහා වෙන්කළ රු.2,987,400,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23ක් හෙවත් රු.699,261,648 ක් ඉතිරි වී තිබුණි. | 2021 වර්ෂය තුළ කොරෝනා වසංගතය නැවත වැඩිවීමත් සමග රටෙහි ඇති වූ තත්වය හා නිලධාරීන් සීමා කර ගෙන්වීම ආදී නොවැලැක්විය හැකි හේතුන් මත ආයතන කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවීම නිසා අපේක්ෂිත අයුරින් වියදම් දැරීමේ හැකියාවක් නොලැබුණි. තවද, 2021.08.28 දිනැති අංක MF/NB/07/CM/2021/163 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ උපදෙස් පරිදි රු.7,900,000 ක ප්‍රතිපාදන ඉතිරි කිරීමට එකඟ වී තිබුණි. | වෙන්කළ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලටඅනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ.104 (3) හා (4) | පාඩු හෝ අලාභහානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාද වේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු වුවත්, 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදු වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සහ වාහන අනතුරු 8 ක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ ආරම්භයේ ඇති වූ කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය සහ නිරෝධායන හේතු මත කාර්යාලය වසා දැමීමට සිදුවීමත් කාර්ය මණ්ඩලය කණ්ඩායම් වශයෙන් සීමාවන් සහිතව කැඳවීමට සිදුවීමත් හේතුවෙන් අදාළ පරීක්ෂණ සඳහා නිලධාරින් පත්කිරීම සහ පත්කළ නිලධාරින්ගේ රාජකාරි බහුලත්වය හේතුවෙන් පරීක්ෂණ කටයුතු පවත්වාගෙන යාමට බාධා සිදු විය. අදාළ පරීක්ෂණ අවසන් වූ වහාම වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | නොපමාව රෙගුලාසි ප්‍රකාර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

(ආ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ

-----------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් අමාත්‍යාංශයට අයත් වාහන 33 ක් සඳහා අදාළ ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | 2020 හා 2021වර්ෂය තුළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය සහ වියදම් කළමනාකරණය කිරීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට බාධා ඇතිවිය. 2022.01.31 දින වන විට වාහන 02 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව ඉන්ධන පරීක්ෂණ සිදුකළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021.12.29. දින වන විට ඉඩම් අමාත්‍යාංශයට අදාළව පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය සකස් කර අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය තුළ ප්‍රදර්ශනය කර ඇත. පුරවැසි ප්‍රඥාප්තිය ප්‍රදර්ශණය කිරීමේ ස්ථානය තෝරාගැනීමේ සහ අමාත්‍යාංශයෙහි කාර්යභාරයෙහි සිදුවුණු වෙනස හේතුවෙන් සකස්කල ප්‍රඥාප්තිය ප්‍රදර්ශනය නොකළ අතර, අනවශ්‍ය වියදම් සීමා කිරීමට සිදුවී ඇති බැවින් පුරවැසි ප්‍රඥප්තිය මුද්‍රණය කර නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කරගෙන ආයතනයේ සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්ය සාධන ගිවිසුම මේ වන විට සකස්කර ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කාර්යය සාධන ගිවිසුම් අත්සන් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බිම්සවිය ව්‍යාපෘතිය 2007 වර්ෂයේ දී ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වසර 15 ක් සම්පූර්ණ වී තිබුණු අතර, ඒ සඳහා දරා ඇති සමස්ත පිරිවැය රු.5,635,684,728 ක් වී තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක 18 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 ක පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, වවුනියාව, අම්පාර, මුලතිව්, කිලිනොච්චිය, මඩකලපුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 07 හි මෙම වැඩසටහන ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව 2007 වසරේ සිට ආරම්භ කරන ලදුව මේ දක්වා වසර 15 කට ආසන්න කාලයක් ක්‍රියාත්මකව පවතී. මේ වන විටත් ඔබ වාර්තාවේ සඳහන්ව ඇති පරිදි රු.5,635,684,728 ක් වැය වී ඇති අතර රජයේ සහ පෞද්ගලික ඉඩම් කැබලි මිලියන 1.6 ක් මැන විමර්ශනය කර අවසන් තීරණය ලබා දී ඇත්තේ කැබලි 580,000 ක් පමණි. එයින් නීත්‍යානුකූල හිමිකම්ලාභීන් 285,000 කට පමණක් සහතික නිකුත් කර ඇත. ඒ අනුව මේ කාලය තුළ වැය කර ඇති මුදල හා සලකා බැලීමේදී එක් හිමිකම් තීරණයක් සඳහා රු.9,717 ක් වැය වී ඇත. ලබා ගෙන ඇති ප්‍රතිඵලය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින්, ඉදිරියේදී නව වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරීම පිළිබඳව සැලසුම් සකස් කරමින් පවතින බව සඳහන් කළ හැකිය. | බිම්සවිය වැඩසටහන දිවයින පුරාම ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොරියානු ණය ආධාර යටතේ වර්ෂ 2020 -2023 අතර කාලයේදී ඉඩම් දත්ත යටිතල පහසුකම් සහ ඉඩම් තොරතුරු සේවා පද්ධතිය යටතේ, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) උපදේශකත්වය සහ තාක්ෂණික සහය ලබා ගැනීම, තොරතුරු විශ්ලේෂණය හා දත්ත පදනම සැකසීම, දෘඩාංග හා ආශ්‍රිත සේවා ප්‍රසම්පාදනය කිරීම, නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් ආරම්භ කර නොතිබුණි. | කොරියානු ණය ආධාර යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සඳහා විදේශ ණය ව්‍යාපෘතියක් ලබා ගැනීමේ කටයුතු සැලසුම් කළද, විදේශ ව්‍යාපෘති සම්බන්ධ ප්‍රධාන කාර්යයන් මුදල් අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ. මෙතෙක් ශ්‍රී ලංකා රජය හා කොරියානු රජය අදාළ ණය ගිවිසුම අත්සන් නොකිරීම මත ව්‍යාපෘතිය ආරම්භ කර නොමැත. තවද අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ පසුව දැරීමට සිදුවන පද්ධති නඩත්තු වියදම් ඉහළ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුද යන්න අමාත්‍යාංශය තවදුරටත් අධ්‍යනය කරමින් පවතී. | සැලසුම්කළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉඩම් අමාත්‍යාංශයේ 2021 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් දේශීය කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා තෘණ වගාව, බඩ ඉරිඟු සහ අනෙකුත් භෝග වගාකිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හඳුනාගෙන තිබුණද, සැලසුම් කළ පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සම්බන්ධ වී සුදුසු ආයෝජකයින් වෙත දීර්ඝකාලීන බදු පදනම යටතේ අදාළ ඉඩම් ලබාදීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී එම වැඩපිළිවෙල යටතේ ඉඩම් බැහැර කිරීම සඳහා නිර්දේශයන් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ලැබී නොමැති අතර මුල් පියවර යටතේ ආයෝජකයින් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම සිදුව තිබුණද, මුල් අවස්ථාවේදී තෝරාගත් ඉඩම් ආයෝජකයින් විසින් ප්‍රතික්ෂේප කිරීම, ව්‍යාපෘති සඳහා එකඟත්වය පළ කළද ආයෝජකයින් ඉදිරි කටයුතු සිදු නොකිරීම, ඇතැම් ඉඩම් වල ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා ආයෝජකයින් අවසර ඉල්ලා තිබුණද, ඉඩම් හිමිකාරීත්වය දරන ආයතන ඒ සඳහා එකඟ නොවීම හා බැහැර කිරීම සඳහා අදාළ ආයතන නිර්දේශ ලබානොදීම වැනි හේතූන් මත ඉදිරි කටයුතු වරින්වර නතර වී තිබුණි. | සැලසුම්කළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුමේ ඇතුළත්ව තිබුණු කාර්යයක් වූ ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් සංශෝධිත ආකෘතිපත් සහ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහය කෙටුම්පත් කර ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනයෙන් පසු මාර්ගෝපදේශ සංග්‍රහය නිකුත් කිරීමට අපේක්ෂා කරයි. | සැලසුම්කළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------- |
| (අ) | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව “ශ්‍රී ලංකාව තුළ කෘෂි, වාණිජ, සංචාරක වෙනත් සේවා නිෂ්පාදන අංශ නියෝජනය කරමින් විවිධ නිෂ්පාදනයන්හි නියැලී සිටින එමෙන්ම එවැනි ව්‍යවසායකත්ව හැකියාව ඇතත්, ඒ සඳහා මූලික සම්පත් සහ රාජ්‍ය සහය තවමත් ලැබී නොමැති තරුණයින් තෝරාගෙන ඔවුන් වෙත ඉඩම් හිමිකම ලබාදීම මගින් දේශීය නිෂ්පාදන දිරිගැන්වීම සහ ඊට අවශ්‍ය ආයතනික | තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා රජයේ ඉඩම් වල ආයෝජන අවස්ථා ලබා දීමේ වැඩසටහන උතුරු පළාතේ හැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 263 ක ක්‍රියාත්මක කළ අතර, අයදුම්පත් 419,135 ක් ලැබී ඇති අතර, එමඟින් 100,000 පමණ සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වී 50,000 ක් පමණ ඉඩම් ලබා දීම සඳහා තෝරා ගෙන ඇත. ඉඩම් හඳුනා ගැනීමේ ගැටලුව, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය ආදී කරුණු නිසා 2021 වර්ෂයේ | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහය ලබාදීමේ" අරමුණින් ක්‍රියාත්මක කළ වැඩසටහනක් මගින් 2021 වර්ෂය අවසන් වන විට ඉඩම් කැබලි 20,000 ක් ලබාදීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා ඉඩම් කැබලි 402 ක් හෙවත් සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 2 ක් පමණක් ලබා දී තිබුණි. | ඉඩම් කැබලි 20,000 ක් බෙදා දීමේ සැලසුමට ලඟා වීමට නොහැකි වුවත් එයින් 2022.07.31 වන විට 1098 ක් සඳහා ඉඩම් ලබා දී ඇත. | |
| (ආ) | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව නාගරික සංවර්ධනය, පහත් බිම් සංවර්ධනය, ගම් පුළුල් කිරීම, වාරිමාර්ග කටයුතු යනාදී වශයෙන් ක්ෂේත්‍ර 11 ක් යටතේ ඉඩම් අත්පත්කර ගැනීමට සැලසුම් කර තිබුණද, එයින් ක්ෂේත්‍ර 07 ක් යටතේ පමණක් ඉඩම් අත්පත්කර ගැනීම ආරම්භකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අත්පත්කර ගැනීමට සැලසුම් කළ ඉඩම් හෙක්ටයාර් 7383 න් ඉඩම් හෙක්ටයාර් 707 ක් හෙවත් සියයට 10 ක් පමණක් පවරාගෙන තිබුණි. ඒ අනුව සැලසුම් කළ පරිදි රජයේ අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් පවරා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා රජයේ ඉඩම් වල ආයෝජන අවස්ථා ලබා දීමේ වැඩසටහන උතුරු පළාතේ හැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 263 ක ක්‍රියාත්මක කළ අතර, අයදුම්පත් 419,135 ක් ලැබී ඇති අතර, එමගින් 100,000 පමණ සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වී 50,000 ක් පමණ ඉඩම් ලබා දීම සඳහා තෝරා ගෙන ඇත. ඉඩම් හඳුනා ගැනීමේ ගැටළුව, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය ආදී කරුණු නිසා 2021 වර්ෂයේ ඉඩම් කැබලි 20,000 ක් බෙදා දීමේ සැලසුමට ලඟා වීමට නොහැකි වුවත් එයින් 2022.07.31 වන විට 1098 ක් සඳහා ඉඩම් ලබා දී ඇත.<br>මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී ඉඩම් හඳුනා ගැනීමක් සිදු කර නොමැති අතර, පසුව හඳුනා ගන්නා ලද ඉඩම් ද ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති සඳහා නොගැලපෙන බව සඳහන් කර ප්‍රතික්ෂේප කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 ව්‍යාපෘතීන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------- | ------------- |
| (අ) | රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ඉඩම් අත්පත් කරගැනීමට අදාළ වන්දි මුදල් ප්‍රමාදයකින් තොරව ගෙවීම සහ ප්‍රමාදය මත ගෙවීමට සිදු වී ඇති අධික පොලී මුදල් අඩුකරගැනීමේ අරමුණ ඇතිව අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සංශෝධන කිරීමට සැලසුම්කර තිබුණද, 2021 වර්ෂය අවසන්වන විටත් අදාළ සංශෝධනය සිදුකර නොතිබුණි. | පනත් කෙටුම්පත සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක සමඟ මේ සම්බන්ධයෙන් කිහිපවාරයක් සාකච්ඡා කර මූලික පනත් කෙටුම්පත සකස් කර ඇත. මූලික පනත් කෙටුම්පතට අදාළ නිරීක්ෂණ නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනත කඩිනමින් සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019, 2020 හා සමාලෝචිත වර්ෂයට අදාළව ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක ගොනු ගණනින් වන්දි ගෙවා වැඩ අවසන්කළ ගොනු ගණන සියයට 2 කට අඩු අගයක් ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක වුණු ගොනු 9073 න් වැඩ අවසන් කළ ගොනු ගණන 13 ක් පමණක් විය. ඒ අනුව අත්පත් ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වී කඩිනමින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | මෙම ගොනු 9073 පෙර වර්ෂ කිහිපයක සිට ක්‍රියාත්මක වන ගොනු වන අතර 2021 වර්ෂය තුළදී පමණක් සියලුම ඉඩම් කොටස් සඳහා වන්දි සහ පොලී ගෙවා රජයේ අයිතිය ලියාපදිංචි කර වැඩ අවසන් කරන ලද ගොනු ගණන 13 කි. එක් ගොනුවක් තුළ ඉඩම් කැබලි විශාල සංඛ්‍යාවක් පැවතීම, සියලුම ඉඩම් කැබලි සඳහා වන්දි සහ පොලී ගෙවා අවසන් කරන තෙක් අදාළ ගොනුව වැඩ අවසන් ගොනුවක් ලෙස නොසැලකීම, අත්පත් තොරතුරු අමාත්‍යාංශය වෙත ලැබීමේ ක්‍රමවේදයේ දුර්වලතා පැවතීම සහ 2021 වර්ෂයේ රටේ පැවති වාතාවරණය ප්‍රගතිය අඩුවීමට බලපා තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් මෙම අමාත්‍යාංශය විසින් භාවිතා කළද, අදාළ වාහන පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අංක KQ-6211 සහ JO-9536 දරන වාහන භෞතිකව අමාත්‍යාංශය සතුව පැවැතියද, එහි අයිතිය පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අංශය සතු බැවින් අපගේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමේ හැකියාවක් නොමැත. මෙම වාහන දෙක 2021 වර්ෂයේ දී 130 ශීර්ෂය යටතේ ගිණුම් වල වාර්තා වී ඇත. | අදාළ වාහන පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක KV-0433 දරන රථයට සමාලෝචිත වර්ෂයේ ජූලි 19 දින සිදු වූ රිය අනතුර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යටතේ ඉදිරිපත් කළ සටහන (ii) යටතේ සහ මු.රෙ. 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනයෙහි සටහන් කර නොතිබුණි. | අංක KV- 0433 දරන රථය තාවකාලිකව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු අතර මෙම අනතුර එම දෙපාර්තමේන්තුවේ දී සිදු වී ඇත. එම සිදුවීම පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කර නොතිබුණු අතර නැවත රථය මෙම අමාත්‍යාංශයට භාරගත් පසු මු.රෙ. 104 යටතේ මූලික පරීක්ෂණ ආරම්භකර ඇත. | මු.රෙ. 110 ප්‍රකාරව හානි හා පාඩු සටහන් කළ යුතුය. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාබනික පොහොර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මැයි 25 දින ඉඩම් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අංක 5/6/1/1/CM/21/III දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි 07 දින ගනු ලැබුණු අංක 21/0949/322/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරන පොහොර සඳහා, 1988 අංක 68 දරන පොහොර පනතේ 2 (1)(2) වගන්ති ප්‍රකාරව ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා 2021.12.07 දින පොහොර ලේකම් කාර්යාලයට අයදුම්පත් යොමුකර අදාළ පොහොර සාම්පලද එම කාර්යාලය වෙත ලබා දී තිබුණද, මේ දක්වා අදාළ ලියාපදිංචි අංකය හා පොහොර අලෙවි කිරීමේ බලපත්‍රය නිකුත් කර නොමැත.<br>කෙසේ වුවත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රයෝගික නොහැකියාව හා දුර්වලතා, තෙල් මිල ඉහල යාම හේතුවෙන් ප්‍රවාහන වියදම් ඉහළ යාම, අමුද්‍රව්‍ය හිඟය හා ඒවායේ මිල ඉහළ යාම, හා කාබනික පොහොර භාවිතය ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස පැවති රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීම යන හේතූන් මත මෙම නියමු ව්‍යාපෘතිය වර්තමානය වන විට නවතා ඊට අදාළ දේපළ, උපකරණ හා පොහොර ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඔවුන්ගේ ව්‍යාපෘතියක් ලෙස කරගෙන යාම සඳහා පැවරීමට තීරණය කර ඇත. | 1988 අංක 68 දරන පොහොර පනත ප්‍රකාරව පොහොර නිෂ්පාදනය සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය. |
| (ආ) | 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීම් පනතේ 35 වගන්තිය අනුව, ඉඩමක් හෝ පරවශතාවක් අත්කරගැනීම සඳහා 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයට පෙරාතුව වන්දි මුදල් ඒ තැනැත්තාට හෝ උසාවියට නොගෙවනු ලැබුණු අවස්ථාවක, අදාළ ආඥාව නිකුත් කළ දිනයේ සිට වන්දි ගෙවීම කරන දිනය දක්වා නියමිත ප්‍රමාණයක පොලිය සමග වන්දි මුදල ගෙවිය යුතු වුවත්, පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු | පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වෙමි. අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආයතන රාශියක දායකත්වයෙන් සිදුවන අතර පනතේ ප්‍රතිපාදන අනුව අත්කර ගැනීම් අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වේ. එම ප්‍රමාදයන් නිසා විශාල පොලී මුදලක් ගෙවීමට සිදුවන අවස්ථා පවතී.<br>ඉඩම් අත්කර ගැනීම් සඳහා පොලී මුදලක් ගෙවීමට සිදු වන්නේ ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව වන්දි ගෙවීමට පෙර ඉඩමේ | අත්පත්කර ගැනීමේ හා වන්දි ගෙවීමේ කටයුතු කාලීනව සිදුකර පොලී ගෙවීම් අවමකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොකිරීමේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුළු පොලී මුදල වූ රු.1,206,317,960 න් රු.602,135,211 ක් හෙවත් සියයට 50 ක් වසර 15 කට වැඩි කාලයකට පෙර ඉඩම් අත්පත් කිරීම් වෙනුවෙන් දරා තිබුණු පොලී වියදම් විය. | භුක්තිය භාර ගැනීමට සිදුවන අවස්ථාවලදී පමණක් වන අතර, අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් එම ක්‍රමවේදය අනුගමනය කිරීමට අදාළ ආයතන දැනුවත් කර ඇත. | |
| (ඇ) | අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට අවශ්‍ය රු.2,513,476,724 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කළද, අදාළ ප්‍රතිපාදන වන්දිලාභියා වෙත ගෙවූ බවට වන තහවුරුවක් ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සඳහා අදාළ තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් කැඳවා ඇති අතර එම තොරතුරු මේ වන විට ලැබී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සමාලෝචනයක් මේ වන විට සිදු කරමින් පවතී. | අදාළ මුදල් වන්දිලාභියා වෙත ගෙවූ බවට තහවුරුවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ලබාගත යුතුය. |
| (ඈ) | 2012 වර්ෂයේදී වෙරැස්ස ගඟ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බොරලැස්ගමුව, පිටවෙල්ල පාර හා බොරුපන පාලම අතර ඇති අතහැර දමන ලද වගුරු බිම් ප්‍රදේශයේ ජල රක්ෂිතයක් නිර්මාණය කිරීම සඳහා බොරලැස්ගමුව වැවේ ගහබඩ කුඹුර, මූනමල්වත්ත, ගහබඩ ඕවිට, දෙල්ගහ ඕවිට, යල් කුඹුර යන ඉඩම්වලින් අක්කර 98 ක් අත්පත් කරගෙන තිබුණි. අදාළ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ නියමය 2012 ජූලි 16 දින ද, 38(අ) වගන්තිය යටතේ අතුරු විධාන ආඥාව 2013 ඔක්තෝබර් 14 දිනැති අංක 1830/51 දරන ගැසට් පත්‍රයේ පළකර තිබුණද, අත්පත් කරගත් මුළු ඉඩම සඳහාම වන්දි හා පොලී මුදල් අත්පත් කරගැනීම් කටයුතු සම්පූර්ණ නොවීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම ආදී හේතු මත මෙතෙක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී විසින් හිමිකම් පරීක්ෂණ පවත්වා හිමිකම් තහවුරු කර ගැනීමෙන් අනතුරුව, හිමිකම තහවුරු කරගත් ඉඩම් කැබලි සඳහා වන්දි ඉල්ලුම්පත්‍ර යොමු කිරීමේ අනුපිළිවෙල අනුව මෙම අමාත්‍යාංශය විසින් කොළඹ දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලබයි. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අදාළ ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |
| (ඉ) | මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දර හා තලල්ල ගම්වල පිහිටි අක්කර 10 රූඩ් 02 පර්චස් 27.26 ක ඉඩම් ගන්දර ධීවර වරාය ඉදිකිරීම සඳහා පවරා ගැනීමට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය ප්‍රකාරව දැන්වීම් පළ කිරීම | ගන්දර ධීවර වරාය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බැවින් හදිසි අවශ්‍යතාවය සඳහා 38 (අ) අතුරු විධානය නිකුත් කර ඇති අතර මේ වන විට පනතේ 5 ප්‍රකාශයද නිකුත් කර ඇත. අත්කර ගැනිම පනත ප්‍රකාරව හිමිකම් තහවුරු කර ගැනීමේ ඉදිරි කටයුතු අවසන් | අදාළ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 21 දින සිදුකර තිබුණු අතර 1950 අංක 09 දරන ඉඩම් අත් පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන ආඥාව 2022 පෙබරවාරි 10 දිනැති අංක 2266/51 දරන ගැසට් පත්‍රයේ පළකර තිබුණි. අදාළ වන්දි ගෙවීම සඳහා රු.31,500,000 ක මුදලක් ධීවර අමාත්‍යාංශය විසින් දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේ ජනවාරි 06 දින ලබා දී තිබුණු අතර එම මුදල් වන්දි හිමිකරුවන්ට ගෙවීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ජංගම ගිණුමක රඳවා තිබුණි. මේ හේතුවෙන් වන්දි සඳහා ගෙවිය යුතු පොලී මුදල් වැඩි වේ. | වීමෙන් පසු වන්දි ගෙවීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඊ) | ඉගිනිමිටිය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම සඳහා අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාරව අතුරු විධාන ආඥාව 1984 වර්ෂයේ නිකුත්කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 38 ක් ගත වී තිබුණු අතර, අදාළ වන්දි මුදල ගෙවීම සඳහා රු.5,122,123 ක ප්‍රතිපාදන මුදලක් 2014 වර්ෂයේ අමාත්‍යාංශය විසින් නවගත්තේගම ප්‍රාදේශිය මහ ලේකම් වෙත නිකුත්කර වර්ෂ 07 කට වැඩි කාලයක් ගතවී ඇතත් එම මුදල් ගෙවීමට කටයුතුකර නොමැති බව නිරීක්ෂණය විය. තවද, 2022 පෙබරවාරි 21 දිනැති NWG/LSD/1/ACQU1/1/6 අංක දරන නවගත්තේගම ප්‍රාදේශිය මහ ලේකම් විසින් නිකුත් කළ ලිපිය මඟින් ඉගිනිමිටිය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් වන්දි ගෙවිය යුතු ඉඩම් කැබලි අංක හඳුනාගත නොහැකි බවද අමාත්‍යාංශය වෙත වාර්තා කර තිබුණි. | ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන කාලය තුළ තැන්පත් කර ඇති මුදලකි. ඒ සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරු නොමැති බැවින් පොදු තැන්පත් ගිණුමේ ඇති ප්‍රතිපාදන යොදා ගෙන මෙතෙක් වන්දි ගෙවා නොමැති ඉඩම් කොටස් සඳහා වන්දි ගෙවන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. | අදාළ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |
| (උ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 05 ක ඉඩමක් ගාල්ල, බද්දේගම තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා අත්පත් | 2000 වර්ෂයේදී අත්කර ගැනීම ආරම්භ කර අදාළ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි 2001 වර්ෂයේදි 38(අ) අතුරු විධාන ආඥාව නිකුත් කර අත්කර ගැනිමේ ඉදිරි කටයුතු | අදාළ ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීමට අදාළව ඉඩම් අත්කර ගැනීමේ පනතේ වගන්ති අංක 02 යටතේ දැන්වීම් පළකිරීම 2000 වර්ෂයේදී ද, වගන්ති අංක 38(අ) යටතේ අතුරු ආඥාව නිකුත් කිරීම 2001 වර්ෂයේදී ද සිදුකර තිබුණි. වටිනාකම රු.8,000,000 ක් වූ වන්දි මුදල් ගෙවීම 2020 ඔක්තෝබර් 27 දින දක්වා ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂ 19 ක් සඳහා සියයට 07 බැගින් රු.10,790,740 ක පොලී මුදල් ගෙවීමට සිදු වී තිබුණි. | ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කර ඇත. මු.රෙ. 53 යටතේ ඉඩම් අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදන මගින් වන්දි ගෙවීමට අනුමැතිය ලැබී ඇත්තේ 2010 වර්ෂයේදී වේ. නමුත් ප්‍රාදේශිය ලේකම් විසින් වන්දි අයදුම් පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ 2019 වර්ෂයේදි වන බැවින් ඒ අතර කාල සීමාව සඳහා පොලී ගෙවීමට සිදු වී ඇත. මේ වන විට අත්කර ගැනීම සඳහා සියලුම වන්දි හා පොලී මුදල් නිදහස් කර ඇත. | |
| (ඉ) | වලතර කණිටු විදුහලට ක්‍රීඩා පිටියක් සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව ඩෝරා ජයසූරිය යන අයට අයත් අක්කර 01 රූඩ් 03 පර්චස් 34.5 ක් පවරා ගන්නා බවට වන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 02 වන වගන්තිය ප්‍රකාරව පළ කළ යුතු දැන්වීම 2005 ජූලි මාසයේදී පළ කර තිබුණද, 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 16 ක පමණ කාලයක් ගත වුවත් ඉඩම් අත්පත් කර ගැනීමේ ඉදිරි කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. තවද, යෝජිත ඉඩම දැනටමත් පාසලේ කටයුතු සඳහා පරිහරණය කරන බව 2018 පෙබරවාරි 05 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් නිකුත් කර ලිපිය මගින් ඉඩම් අමාත්‍යාංශය වෙත වාර්තා කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | 2005 වර්ෂයේදී 02 වගන්ති දැන්වීම පළ කිරීමෙන් අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණද එහි ඉදිරි කටයුතු වසර ගණනාවකින් සිදු වී නොමැති බව නිරීක්ෂණය වූ බැවින් නව අත්කර ගැනීමේ යෝජනාවක් එවන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත වරින්වර දන්වා ඇත. මෙතෙක් නව අත්කර ගැනීමේ යෝජනාවක් ඉදිරිපත් කර නොමැති බැවින් දැනට පවතින අත්කර ගැනීම අක්‍රිය ගොනුවක් ලෙස සලකා කටයුතු කරන අතර, අත්කර ගැනීමේ යෝජනාවක් ඉදිරිපත් වුවහොත් නව අත්කර ගැනීමක් ලෙස නැවත ආරම්භ කිරීමට හැකියාව ඇත. | අදාළ ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර කඩිනමින් වන්දි ගෙවිය යුතුය. |

## 4 මානව සම්පත් කළමණාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------ | --------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 638 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 569 ක් වූයෙන් 69 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතුණි. | 2021.12.31 දිනට පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමට අදාළ තනතුරු දීප ව්‍යාප්ත සේවයේ තනතුරු බැවින් ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් | අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනයට හෝ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | දමන ලෙස අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී තිබුණු බැවින් ඒ අනුව කටයුතු කර ඇත. | |
| (ආ) | අමාත්‍යාංශය අනුමත වී තිබුණු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක නිලධාරීන් 08 දෙනෙකුගේද තෘතියික මට්ටමේ තනතුරක නිලධාරියෙකුගේද ද්විතීක මට්ටමේ තනතුරු 05 ක නිලධාරීන් 44 දෙනෙකුගේද ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක සේවකයන් 14 දෙනෙකුගේ හා වෙනත් තනතුරු 02 කට අදාළ සේවකයන් 02 කු ගේද පුරප්පාඩු පැවතුණි. | 2021.12.31 දිනට පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ හා ද්විතියික මට්ටමට අදාළ තනතුරු දීප ව්‍යාප්ත සේවයේ තනතුරු බැවින් ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් දමන ලෙස අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කර ඇත. | අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනයට හෝ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |